

# ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා රේගු දෙපාර්තමේන්තුව තුල ඇති ජෛව විවිධත්ව ආරක්ෂණ අංශයේ ඇති වැදගත්කම සහ එහි පැවැත්මේ ඇති වැදගත්කම.

## හැඳින්වීම

අද ශ්‍රී ලාංකීය පුරවැසියන් වැඩි ප්‍රමාණයක් අප රටේ හරිත රන්කෙත වන ජෛව විවිධත්ව සංරක්ෂණය අත්‍යවශ්‍ය කාරණයක් බව නිතැතින්ම පිලිගෙන තිබේ. තවදුරටත්, අප සියලුදෙනාම අපගේ පරිසරය පිළිබඳවද එහි ජීවී ගුණය රඳා ඇති සුවදායි වටපිටාව පිළිබඳවද අපගේ එදිනෙදා ආහාර සහ නොයෙක් කර්මාන්ත අමු ද්‍රව්‍යය, ඖෂධ වර්ග සහ සොබා සෞන්දර්යාත්මක අගය පිළිබඳවද සංස්කෘතික විවිධත්වයන් ද එක් කරනු ලබන ජෛව විවිධත්වය පිළිබඳව ද දැඩි අවධානයක් යොදමින් සිටිමු.

එහෙත් මානව ක්‍රියාකාරකම් හේතුකොට ගෙන මෙම අගනා ජෛව විවිධත්වය අතිශයින් හානිදායක තත්වයනට පත්ව ඇති අතර, එනිසාම පෙර සඳහන් කල සංස්කෘතික අංග අප අතුරින් ශ්‍රීඝ්‍රයෙන් ගිලිහෙමින් පවතී. මෙම සෝදාපාළුව නිසාම ජෛව විවිධත්ව සංරක්ෂණය දැඩි අවධානයට ලක්ව ඇත. පරිසර සංරක්ෂණය සාක්ෂාත් කර, එමගින් සමස්ථ ජනතාවගේ සුභසාධනය ඇති කිරීම මෙහෙවර වී ඇති පරිසර අමාත්‍යාංශය එම උදාර කාර්ය ඉටුකිරීමේදී විවිධ පුද්ගලයින්, ආයතන සහ සංවිධානවල සහාය නිරතුරුව ලබාගන්නේ ඒ සියල්ලගේම සහාය, කැපවීම සහ දායකත්වය පරිසර සංරක්ෂණයේදී අත්‍යවශ්‍ය වන නිසාය. පරිසර සංරක්ෂණය විෂය තනි ආයතනයක් ලෙස නොව ලක්වාසී සියලු ජනතාවගේ මෙන්ම සියලුම ආයතන සහ සංවිධානවල එකමුතුවෙන් සහ කැපවීමෙන් සිදුකල යුතු ක්ෂේත්‍ර ගණනාවක් තුල විහිදුනු අතිශයින් පුළුල් විෂයක් වීම නිසාය. පරිසර සංරක්ෂණ ක්‍රියාදාමය විශේෂයෙන්ම, ජෛව විවිධත්ව සංරක්ෂණය දිගුකාලීන ප්‍රතිලාභ ලබාදෙන, එහෙත් කෙටිකාලීන ක්ෂණික ප්‍රතිලාභ ලබාගැනීම අපහසු ක්ෂේත්‍රයකි.

මෙම සුවිශේෂී ජෛව සම්පත් නිසි ඇගයීමකට ලක්කර වඩා තාර්කික කළමනාකරණයකට නතු කලහොත්, අප රටට අති විශාල ප්‍රතිලාභ ලඟාකරගෙන ඒවා පරිසර සංරක්ෂණයට සහ අනිකුත් සංවර්ධන අවශ්‍යතා වලට යොමුකර ගත හැක. මනා කළමනාකරණයකින් ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම තුළින් රටට විශාල ප්‍රතිලාභ ලඟා කර ගත හැක. එමගින් රටේ විවිධ ආර්ථික ක්ෂේත්‍රයන් සඳහා දොරටු විවර වනු ඇත.

මෙයට ගත හැකි ඉතා හොඳ උදාහරණයක් වන්නේ වනාන්තර සංරක්ෂණයයි. මෙමගින් මනාව වැසි එල ලබාගත හැකි වන අතර එම වැසිඑල ක්‍රමානුකූලව දිගු කාලයක් ලබා ගැනීමට හැකියාව ලබාදෙයි. එමගින් රටේ කෘෂිකර්මාන්තය හා බලශක්ති නිෂ්පාදනය ද තිරසාරව ලබා ගැනීමට හැකි වේ. මෙමගින් ලබා ගත හැකි කෘෂිකාර්මික , සහ කර්මාන්ත සංවර්ධනය අතමහත් වන අතර ජනතාවට මනා සමාජ සුභ සාධනයක් ද ලඟා කර දිය හැක.

## වැදගත්කම

නූතන ජෛව විවිධත්ව සංරක්ෂණයේදී ආරක්ෂාව මෙන්ම නැණවත් භාවිතයද ඉලක්ක කර ගෙන ඇත්තේ, එම ජෛව සම්පත් භාවිතයෙන් ප්‍රාග්ධනය උපදවා ඒවා නැවත සංරක්ෂණයටත් ජනතා සුභ සිද්ධියටත් යොමුකර ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් ඇති කිරීමටය.

ජෛව සම්පත් පරිහරණයෙන් ආදායම ඉපැයීමට නම් එය දේශිය හා අන්තර්ජාතික වෙළඳ ප්‍රවාහයට එක් විය යුතුය. විශේෂයෙන්ම අන්තර්ජාතික ආනයන සහ අපනයන වෙළදාමේ දී ජෛව විවිධත්වය පරිහරනණය මනා පාලනයට යටත් කරීම අත්‍යවශ්‍යය. මෙහිදී පරිසර අමාත්‍යංශය යටතේ ඇති වනජීවී දෙපාර්තමේන්තුවෙන් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් විශාල මෙහෙයක් ඉටුවන අතර වඩා සුවිශේෂී කාර්යභාරයක් ඉටුවන්නේ ආනයන අපනයන ක්‍රියාවලියේ වැඩි වගකීමක් ඇති රේගු දෙපාර්තමේන්තුවටය. එහි ජෛව විවිධත්වය මූලික කර ගත් සියලු ආනයන අපනයන කටයුතු පරීක්ෂාවට සහ පාලනයට ලක් කරන්නේ ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය

මගිනි. එම නිසා අදටත් මතු අනාගතයටත් ජෛව විවිධත්ව සංරක්ෂණයට අත්‍යවශ්‍ය ආයතනයක් ලෙස ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය පරිසර අමාත්‍යාංශය විසින් ප්‍රමුඛ තත්වයෙහිලා පිළිගනු ලැබේ.

### ජෛව විවිධත්වය සහ රේගුව එදා සහ අද

ඉතිහාසයේදී ද ශ්‍රී ලංකාව ජෛව විවිධත්ව සංරක්ෂණයේ පෙරගමන්කරු ලෙස ක්‍රියාකර ඇත. මේ සඳහා හොඳම උදාහරණය වන්නේ දේවානම්පියතිස්ස රජු විසින් මිහින්තලාව අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමය.

රුහුණු රාජධානි සමයේ සෙල්ලිපිය මගින් අනාවරණය වන්නේ භාණ්ඩ ආනයන අපනයන කටයුතු වලදී රේගු බදු අය කර ඇති බවයි. මෙහිදී විවිධ ලී, දැව වර්ග, ඇත් දළ සහ අනිකුත් භාණ්ඩ අපනයන පාලනයකට නතුකර එකල පැවැති රජය විසින් බදු අය කරගෙන ඇත. නූතන ජෛව විවිධත්ව සංරක්ෂණයේදී වනජීවී දෙපාර්තමේන්තුව, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් විවිධ කාර්යයන් ඉටුකරයි. විවිධ අණපනත් මගින් එම ආයතනයන්හි ජෛව විවිධත්ව සංරක්ෂණය බලගැන් වී ඇත. එහෙත් වන සත්ත්ව සහ වෘක්ෂලතා ආඥා පනත, වන ආඥා පනත, පැළෑටි සංරක්ෂණ ආඥා පනත ආදිය බලගැන්වීමට පෙර සිටම රේගු ආඥා පනත මගින් ජෛව විවිධත්වය සංරක්ෂණය වී ඇත. එමගින් වලිකුකුළා, හබන්කුකුළා, මොණරා, කහ කුරුල්ලා, සැළලිහිණියා සහ කැහිබෙල්ලා ආදී පක්ෂීන් මෙන්ම ඇත් දළ අපනයනය, කලුවර ලී සහ ලී බඩු අපනයනය සහ මුතු බෙලි ධීවර කර්මාන්තය පාලනයට යටත් කර රේගු බදු අයකර ජාතික ආදායම උත්පාදනයට දායක වී ඇත.

වර්තමානයේ ජාත්‍යන්තර වශයෙන් දිනෙන් දින ඇති වන දැඩි ඉල්ලුම මත ජෛව විවිධත්වයට අයත් ද්‍රව්‍ය ඉතා ඉහළ වෙළඳ වටිනාකමින් යුත් භාණ්ඩ බවට පත් වී ඇත. මේ නිසා විවිධ පුද්ගලයින් එම ද්‍රව්‍ය එලෙසින්ම හෝ නිමි භාණ්ඩ ලෙස අපනයනය කිරීමට පෙළඹී සිටී. වැඩි ලාභ ඉපැයීමේ චේතනාව මුල්කර ගත් ඇතැම් අපනයන කරුවන් විවිධ උපක්‍රම මගින් සහ සාවද්‍ය කරුණු දක්වමින් මෙම ජෛව විවිධත්වයට අදාල ද්‍රව්‍ය අපනයනය කරයි. මේ නිසා රජයට ලැබිය යුතු ආදායමින් ඉතා විශාල ප්‍රමාණයක් අහිමි වී යයි. එම තත්වය තේරුම් ගත් රේගු දෙපාර්තමේන්තුව 1993 දී විශේෂ කාර්ය සාධක කණ්ඩායමක් පිහිටුවා ඇත. එය 1998 දී ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව තුල ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකයක් ලෙස ස්ථාපිත වී අද දක්වා ක්‍රියාත්මක වෙමින් පවතී. රේගු අංශයක් තුල ලොව බිහිවූ ප්‍රථම ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය වන්නේ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකයයි. ලෝකයේ ඕනෑම තැනක ජෛව විවිධත්වය සංරක්ෂණය උදෙසා ආනයන අපනයන පාලන තුලින් කල හැකි කාර්යක්ෂම කාර්යභාරයක් ඉටුකරන සහ ඉටුකල හැකි ඒකකයක් සඳහා පරමාදර්ශී උදාහරණයක් ලෙස සලකනු ලබන්නේ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකයයි.

ශ්‍රී ලංකා රේගුවේ ජෛව විවිධත්ව ආරක්ෂක අංශය මගින් 1993-1995 වසරවල දී අත් අඩංගුවට ගැනීම් 1000 කට වැඩි ප්‍රමාණයක් සිදුකර ඇත. ඒවා අතුරින් කිහිපයක් පහත දැක්වේ.

- විවිධ ජලජ පැලෑටි
- සඳුන්
- තහනම් පොකිරිස්සන්
- ආවේනික මත්ස්‍යයින්
- කොටි හම්
- පුරා වස්තු
- කොතල හිඹුටු
- කුරුඳු පැළ
- දේශීය මත්ස්‍යයින්
- ඇත් දළ
- කළුවර භාණ්ඩ
- නරි ඔලු
- සමනලයින් හා මකුළුවන්
- කැස්බෑ කොටස්
- ක්වාටස් (අපනයනයේදී තීරු බදු ඇති එකම භාණ්ඩය)
- පුරාණ ශ්‍රී ලංකාවේ සිතියම්වල මුල් පිටපත්
- කුරුලු කූඩු
- නුවර යුගයේ රජ මාලිගාවක තිබූ රෙදි පිළි

තවද, කුරුල්ලන් ආදී සතුන් ආනයනය කිරීමේදී සාවද්‍ය වටිනාකම් ප්‍රකාශ කරමින් සිදුකරන වංචා හඳුනාගෙන ඒවාට නියම





අගයන් ලබාදී එම මුදලට අදාල රේගු බදු අය කර ගැනීමෙන් මෙම ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය මගින් සිදුකර ජාතික ආදායම වැඩිකිරීමට දායක වී ඇත. උදාහරණයක් ලෙස ජෛව විවිධත්ව ආරක්ෂණ අංශය පිහිටුවීමට පෙර ශ්‍රී ලංකාවට නිල් සහ රත්‍රන් මැකෝ ගිරව් ආනයනයේ දි එක් පක්ෂියෙකුගේ වටිනාකම වූයේ ඇමරිකානු ඩොලර් 10 -15 කි. එහෙත් එක් පක්ෂියෙකුගේ වර්තමාන වටිනාකම ඇ. ඩොලර් 1500-3000 පමණ වේ.

මෙම කාර්යයන් සාර්ථකව, කාර්යක්ෂමව සහ සාධාරණව ඉටුකිරීමට රේගුවේ ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකයට හැකියාව ලැබී ඇත්තේ එහි සිටින පලපුරුදු සේවක මඩුල්ල නිසාය. මේ නිසා අදාල පරීක්ෂා කරීම්, අත් අඩංගුවට ගැනීම්, විමර්ශන කටයුතු, පරීක්ෂණ කටයුතු, නඩු සහ උසාවි කටයුතු මෙහෙය වීම කාර්යක්ෂමව සිදුවී ඇත.

යම් හෙයකින් ශ්‍රී ලංකා රේගුවේ ජෛව විවිධත්ව ආරක්ෂණ අංශයේ ධාරිතාව, හැකියාව සහ මානව සම්පත් ප්‍රමාණාත්මකව පිරිහීමට භාජනය වුවහොත් පහත සඳහන් ඍණාත්මක බලපෑම් / සිදුවීම් ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණයට ඇති විය හැක.

* ජෛව විවිධත්වයට අදාල විවිධ ද්‍රව්‍ය ආනයනය සහ අපනයන පාලනයෙන් තොරවීම.

* අවිධිමත් ලෙස භාවිතා කිරීම, වෙළඳම පිළිබඳ සොයා බැලීම හා වැටලීම අඩුවීම.

* අධි පාරිභෝජනය නිසා එම සම්පත් දැඩි ලෙස හායනයට ලක් වේ.

* නීති විරෝධි ලෙස අපනයනය කිරීම.

* නීති ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්ගේ සහ වෙනත් පුද්ගලයින්ගේ දැනුම වර්ධනය අඩු වීම.

* මෙම ද්‍රව්‍ය ආනයනය හා අපනයනය පිළිබඳ නිරතුරු සොයා බැලීම හා පාලනය අඩු වීම.

* ජෛව විවිධත්ව සංරක්ෂණයට අදාල ප්‍රතිපත්ති සහ නීති රීති සකස් කිරීමේදී රේගු අංශයෙන් සිදුවිය යුතු කාර්යයභාරය ගැන වඩා පැහැදිලි ප්‍රතිචාරයක් පරිසර අමාත්‍යාංශයට සහ වෙනත් අදාල ආයතන වලට ලබා ගැනීමට නොහැකි වීම.

* අපගේ අගනා ජෛව සම්පත කූට ව්‍යාපාරිකයන්ට නතුවීම.

* ජාතික ආදායම අඩුවීම

* ජාතික සොරකම හා අනවසර වෙළඳම ඉහල යාම

### ශ්‍රී ලංකාවේ රේගු දෙපාර්තමේන්තුවේ ජෛව විවිධත්ව ආරක්ෂණ අංශයේ නිලධාරීන්ගෙන් වෙනත් ආයතන, සංවිධාන සහ පුද්ගලයින්ට සැපයුනු සේවා

1. පරිසර අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ සංරක්ෂණ කාර්යයභාරය ඇති ආයතනවල විවිධ ප්‍රවීණයන්ගේ කමිටුවල සාමාජිකත්වය දරමින් පරිසර සංරක්ෂණ ප්‍රතිපත්ති, නීතිරීති, ක්‍රමෝපායන් සහ මාර්ගෝපදේශ සකස් කිරීමේදි විශේෂඥ දැනුම සහ දායකත්වය ලබා දීම. (මෙම දායකත්වය පුරාවිද්‍යා සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තු වලටත්, කෞතුකාගාරයට සහ නාරා ආයතනයට ලැබේ.)

2. විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී සම්පත් දායකත්වය ලබා දිම.

3. ස්වේච්ඡා සංවිධාන සහ ප්‍රජා මූලික සංවිධාන සමග එක් වී සංරක්ෂණ ක්‍රියාවලියට උරදීම.

4. විවිධ දත්ත පද්ධති සඳහා අදාල තොරතුරු ලබා දීම

5. සංරක්ෂණය සඳහා ඉවහල් වන්නා වූ තොරතුරු සම්පාදනය.

6. අදාල පර්යේෂණ කටයුතු මෙහෙයවා ජාතික ආදායම ඉහල නැංවීමට දායක වීම.

ඉහත සඳහන් කළ ඍණාත්මක බලපෑම් ජෛව විවිධත්වයට සහ එහි සංරක්ෂණයට ඇති වීම වැලැක්වීමට ශ්‍රී ලංකා රේගුවේ ජෛව විවිධත්ව ආරක්ෂණ අංශය තවදුරටත් ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව මානව සම්පත් වලින් සහ භෞතික සම්පත් වලින් වැඩි දියුණුකල යුතු අතර එම අංශය නිසි

ඇගයීමකට ලක්විය යුතුය.

නිර්දේශයන්:

1. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ජෛව විවිධත්ව අංශයේ ධාරිතාව සහ හැකියාවන් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහල නැංවිය යුතුය.

2. ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය, පෝෂණය සහ තිරසාරව පවත්වා ගෙන යාමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුලින් අප සියලුම දෙනා බැඳී සිටින බැවින් එම කාර්යයට උර දෙන ජෛව විවිධත්ව ආරක්ෂණ අංශයට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙන් සහ අනෙකුත් අදාල ආයතන, සංවිධාන සහ පුද්ගලයන්ගේ පරීක්ෂාවට භාජනය වී එම අංශයට වඩාත් කාර්යක්ෂම ලෙස සේවාවක් සැපයීමට හැකිවන පරිදි දිරිගැන්වීම් සහ ඇගයීම් වලට ලක් කල යුතුය.

3.ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකයේ සේවය කරන නිලධාරීන්ට නිසි ආරක්ෂාව ලබාදිය යුතුය.

4. ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව තුල නීත්‍යානුකූලව ස්ථාපිත කල යුතුය.

ඉහත කාර්යයන්හි දී පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යංශය මගින් ලබා දිය හැකි සේවාවන්

1. ජෛව විවිධත්ව ආරක්ෂණ අංශයට අනුබද්ධව පරිසර ඒකකයක් පිහිටුවීම.

2. එම ඒකකයට සුදුසුකම් ලත් නිලධාරීන් කිහිපදෙනෙකු අනියුක්ත කිරීම.(ජෛව විවිධත්ව ආරක්ෂක අංශයේ ප්‍රධානියා යටතේ)

3. අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සහ භෞතික සම්පත් සැපයීම.

4. අදාල අනිකුත් භෞතික සම්පත් ලබාදීම.

අජිත් සිල්වා
නියෝජ්‍ය අධ්‍යක්ෂ(ජෛව විවිධත්ව)

ටී.එම්. අනුරුද්ධ තෙන්නකෝන්
පරිසර කළමණාකරන නිලධාරී
(ජෛව විවිධත්ව අංශය)

